සියලු ම හිමිකම් ඇවිරිණි

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**පදනම් විභාගය - 2012 ජනවාරි**

**(53) ව්‍යාපාර අධ්‍යයනය**
Business Studies

2012-01-22
පස්වරු
[2.00-4.00]

**කාලය: පැය 02 යි.**

- **අයදුම්කරුවන්ට උපදෙස්:**
  (1) මෙම පත්‍රය **A** සහ **B** යන කොටස් දෙකකින් (02) යුක්ත වේ.
  (2) පහත දැක්වෙන පරිදි ප්‍රශ්න **පහකට (05)** උත්තර ලිවිය යුතුය.
    - **A කොටසේ අංක 01 දරණ ප්‍රශ්නයට, සහ**
    - **B කොටසේ ඕනෑම ප්‍රශ්න හතරකට (04).**
  (3) ඉල්ලුම් කරන ලද **මාධ්‍යයට** අදාලව, **එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.
  (4) ලකුණු 100.

පිටු ගණන: 05
ප්‍රශ්න ගණන: 07

---

## A - කොටස

බහුවරණ ප්‍රශ්න
මෙම කොටසේ සියළු ම ප්‍රශ්න වලට උත්තර ලියන්න.
ලකුණු 40.

**01.** පහත සඳහන් එක් එක් ප්‍රශ්නයට **වඩාත්ම නිවැරදි** උත්තරය (1), (2), (3), (4) අතුරෙන් තෝරන්න. එසේ තෝරාගත් උත්තරයට අදාල ඉලක්කම, ප්‍රශ්නයට යොදා ඇති ඉංග්‍රීසි අක්ෂරය සමඟ පිළිතුරු පොතේ ලියන්න.

(A) තනි අයිතිකරු (කේවල ස්වාමි) ව්‍යාපාරයක් හා සසඳන විට හවුල් ව්‍යාපාරයක ඇති විශේෂ වාසිය පහත සඳහන් දෑ අතුරෙන් තෝරන්න:

(1) ඉක්මනින් තීරණ ගැනීම. (2) අසීමිත වගකීම.
(3) නීතිමය පුද්ගලභාවයක් නොමැති වීම. (4) අවදානම බෙදා ගැනීම.

(B) පහත දැක්වෙන ඒවායෙන් වාණිජ සේවාවක් **නොවන්නේ** කුමක්ද?

(1) ව්‍යාපාර පුළුල් කිරීම සඳහා ණය පහසුකම් ලබා ගැනීම.
(2) ගබඩාව සඳහා ආරක්ෂක නිලධාරියෙකු බඳවා ගැනීම.
(3) ජීවිත රක්ෂණ සහතිකයක් ලබා ගැනීම.
(4) ඇගළුම් කර්මාන්තශාලාවක් සඳහා වෛද්‍ය නිලධාරීවරයෙක් බඳවා ගැනීම.

(C) පුද්ගලික සමාගමක් සම්බන්ධයෙන් **අසත්‍ය** වන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද?

(1) උපරිම වශයෙන් කොටස්කරුවන් පනහක (50) සංඛ්‍යාවක් සිටිය හැකිය.
(2) අවම වශයෙන් එක් අධ්‍යක්ෂවරයෙක් සිටිය යුතුය.
(3) අධ්‍යක්ෂකවරුන්ගේ උපරිම වයස් සීමාව අවුරුදු 60 කි.
(4) සියළු ම කොටස්කරුවන් ලිඛිතව එකඟවී ඇත්නම් වාර්ෂික මහා සභා රැස්වීම් වාර්ෂිකව පැවැත්වීමේ අවශ්‍යතාවක් නොමැත.

(D) පහත දැක්වෙන ඒවායින් නෛතික පුද්ගලභාවයක් **නොමැති** ව්‍යාපාර සංවිධාන ව්‍යුහය හඳුනාගන්න:

(1) වගකීම සීමිත පුද්ගලික සමාගම. (2) රාජ්‍ය සංස්ථාවක්.
(3) සීමාසහිත පොදු සමාගම. (4) තනි ව්‍යාපාරයක්.

(E) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය සම්බන්ධයෙන් පහත දැක්වෙන ඒවායින් **අසත්‍ය** වන්නේ කුමක්ද?

(1) හවුල්කරුවන් ප්‍රාග්ධනයට එකසමානව දායක විය යුතුය.

(2) හවුල්කරුන් සපයන ලද සේවාවන් සඳහා වැටුපක් හෝ දීමනාවක් ලබා ගැනීමට හිමිකම් කියයි.

(3) හවුල්කරුවෙක් ප්‍රාග්ධනයට අමතරව සපයන ලද ණය මුදලක් වෙනුවෙන් වාර්ෂිකව 5% ක අවම පොලියක් ලබා ගැනීමට හිමිකම් කියයි.

(4) ඕනෑම වෙලාවක සියළු ම හවුල්කරුවන්ට හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත් පරීක්ෂා කළ හැකිය.

(F) කලාපීය ආර්ථික සහයෝගිතාව සඳහා පහත දැක්වෙන ඒවායින් නිදසුනක් වන්නේ කුමක්ද?

(1) ලෝක වෙළෙඳ සංවිධානය. (2) යුරෝපා සංගමය.

(3) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල. (4) ලෝක බැංකුව.

(G) පහත දැක්වෙන ඒවායින් බලපත්‍රලාභී විශේෂ බැංකුව තෝරන්න:

(1) ජාතික ඉතිරි කිරීමේ බැංකුව. (2) ලංකා බැංකුව.

(3) මහජන බැංකුව. (4) DFCC වර්ධන බැංකුව.

(H) ණය ශ්‍රේණිගත කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන ඒවායින් **අසත්‍ය** වන්නේ කුමක්ද?

(1) ණය ශ්‍රේණිගත කිරීම මගින් පෙන්වා දෙන්නේ සමාගමක් හෝ රජය විසින් හෝ නිකුත් කරන බැඳුම්කර මිලට ගන්නා ආයෝජකයන්ට මුහුණ දීමට සිදු වන අවදානමයි.

(2) ණය ශ්‍රේණිගත කිරීම මගින් පෙන්වා දෙන්නේ ණය ලබා ගන්නන්, ණය ආපසු ගෙවීම පැහැර හැරීමට ඇති හැකියාවයි.

(3) ණය ශ්‍රේණිගත කිරීම යනු බැඳුම්කර වැනි ණය සුරැකුම් පත්වල විභව ආයෝජකයන් සඳහා මූල්‍ය දර්ශකයකි.

(4) ණය ශ්‍රේණිගත කිරීම යනු බදු සහන ලබා ගැනීම සඳහා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු මූල්‍ය ලියවිල්ලකි.

(I) චෙක්පතක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී, බැංකුකරුගේ යුතුකම වන්නේ පහත සඳහන් අය අතුරෙන් කාගේ උපදෙස් පිළිපැදීමද?

(1) ආදායකයා. (2) අණකරු. (3) අණලද්දා. (4) කලමනාකරු.

(J) පහත දැක්වෙන ඒවායින් අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්යයක් **නොවන්නේ** කුමක්ද?

(1) ශ්‍රී ලංකාවේ නිෂ්පාදිතවල අපනයන ක්‍රියාකාරීත්වය සංවර්ධනය සහ දියුණු කිරීම් සඳහා අපනයන අලෙවිකරණ සහාය සැපයීම ය.

(2) ගෙවීම් නොකරන අපනයන ඉන්වොයිසි සඳහා අපනයනකරුවන්ට රක්ෂණය සැපයීම ය.

(3) අපනයනකරුවන් සඳහා අවශ්‍ය කරන අවවාද සහ උපදෙස් සේවා සැපයීම ය.

(4) අන්තර්ජාතික වෙළෙඳ පොළවල් ගවේෂණය කිරීම සඳහා අපනයනකරුවන්ට විද්‍යුත් ව්‍යාපාර විසඳුම් සැපයීම ය.

(K) පහත දැක්වෙන ඒවායින් රක්ෂණය කළ නොහැකි අවදානම වන්නේ:

(1) ගනුදෙනුකරුවන් විසින් නොගෙවන ලද ණය
(2) සේවකයන් විසින් කරන ලද සොරකම් නිසා සිදු වූ අලාභ
(3) ත්‍රස්තවාදී කටයුතු නිසා සිදු වූ අලාභ
(4) මෝස්තරය වෙනස් වීම නිසා භාණ්ඩ අලෙවි නොවීමෙන් සිදු වූ අලාභ.

(L) අවදානම් සහිත තොරතුරු වසන් කිරීමකින් හෝ නොමඟ යැවීමකින් හෝ තොරව ගැනුම්කරුවෙකු සහ විකුණුම්කරුවෙකු අතර ගනුදෙනුවක් සිදු වීම සඳහා තිබිය යුතු අවම සම්මතය හඳුන්වනු ලබන්නේ:

(1) ආදේශනය. (2) ආසන්නතම හේතුව.
(3) දායකත්වය. (4) උපරිම විශ්වාසය.

(M) පහත සඳහන් දෑ අතුරෙන් ඒකක භාර වලට අදාලව **සාවද්‍ය** ප්‍රකාශය කුමක්ද?

(1) ඒකක භාරයක් යනු ඒකක මහජනයා වෙත විකිණීම මගින් මුදල් එක්රැස් කිරීමෙන් ඇතිකරන ආයෝජන අරමුදල් වල එකතුවකි.
(2) ඒකකභාර ව්‍යාපාර වස්තු හුවමාරුපොළ මගින් එහි අරමුදල් ආයෝජනය කරයි.
(3) තම කොටස් ආපසු මිලදී ගැනීමට ඒකකභාරවලට අයිතිය තිබේ.
(4) තම කොටස් ආපසු මිලදී ගැනීමට ඒකකභාර වලට අයිතිය නැත.

(N) ඉල්ලුම් තැන්පතු ගිණුම් පවත්වාගෙන යා හැක්කේ:

(1) බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට ය. (2) බලපත්‍රලාභී වාණිජ බැංකුවලට ය.
(3) ශ්‍රී ලංකා මහ බැංකුවට ය. (4) ඉහත සියළුම බැංකුවලට ය.

(O) පහත දැක්වෙන ඒවායින් ප්‍රාග්ධන වෙළෙඳ පොළ උපකරණ පමණක් ඇතුලත් කණ්ඩායම තෝරන්න:

(1) පොරොන්දු නෝට්ටු, ඒකක භාර, ණයකර.
(2) භාණ්ඩාගාර බිල්පත්, වාණිජ පත්‍රිකා, පොරොන්දු නෝට්ටු.
(3) වාණිජ පත්‍රිකා, ඒකක භාර, සාමාන්‍ය කොටස්.
(4) ණයකර, සාමාන්‍ය කොටස්, ඒකක භාර.

(P) පහත දැක්වෙන ඒවායින් ශ්‍රී ලංකා විනිමය කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණක් **නොවන්නේ** කුමක්ද?

(1) ආයෝජකයෝ ආරක්ෂා කිරීම.
(2) බ්‍රෝකර් සමාගම්වලට ණය පහසුකම් සැපයීම.
(3) වෘත්තීය ප්‍රමිතීන් නඩත්තු කිරීම.
(4) ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා වන්දි අරමුදලක් ක්‍රියාත්මක කිරීම.

(Q) රක්ෂණ ගාස්තු සහ නම් කරන වරාය තෙක් අනෙකුත් සියළු ම ගාස්තු ඇතුළත් මිල දැක්වෙන ඉන්වොයිසියක් හැඳින්වෙන්නේ:

(1) එකස්-ශිප් මිල (Ex-ship price). (2) සී.අයි.එෆ්. මිල (CIF price).
(3) එෆ්.ඕ.බී. මිල (FOB price). (4) එල්.ඕ.සී.ඕ. මිල (LOCO price).

(R) සඵල ආරක්ෂණ අනුපාතිකය මගින් මනිනු ලබන්නේ:

(1) ආනයන මත බදු පැනවීමට පෙර දේශීය වශයෙන් වටිනාකමට එකතු කළ ප්‍රමාණයයි.
(2) ආනයන මත බදු පැනවීමට පසු දේශීය වශයෙන් වටිනාකමට එකතු කළ ප්‍රමාණයයි.
(3) ආනයන මත බදු පැනවීමෙන් පසු දේශීය වශයෙන් වටිනාකමට එකතු කරන ලද ප්‍රමාණයේ ඉහළ යාමයි.
(4) නිදහස් වෙළෙඳාම යටතේ දේශීය වටිනාකමට එකතු කරන ලද ප්‍රමාණයේ ඉහළ යාමයි.

(S) "සාපේක්ෂ වාසි න්‍යාය" ගොඩනැන්වීමේ දී භාවිත කර **නොමැති** උපකල්පනය වන්නේ:

(1) නිෂ්පාදනයේ දී රජයේ බලපෑමක් නොමැති වීම ය.
(2) වෙළෙඳ සංරෝධක පැවතීම ය.
(3) භාණ්ඩ දෙවර්ගයක් සහ රටවල් දෙකක් පමණක් සැලකිල්ලට ගැනීම ය.
(4) දෙරටෙහි සම්පත් හිමිකාරත්වය ස්ථාවරව හෝ නොවෙනස්ව පැවතීම ය.

(T) ගෙවුම් ශේෂ ලේඛනයේ භාණ්ඩ අපනයන සහ ආනයන අතර වෙනස හඳුන්වනු ලබන්නේ:

(1) වෙළෙඳ ශේෂය. (2) ආදායම් ශේෂය.
(3) වර්තන ගිණුමේ ශේෂය. (4) සමස්ත ශේෂය.

(එකකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 40)

## B - කොටස

මෙම කොටසෙන් ඕනෑම **ප්‍රශ්න හතරකට (04) පමණක්** උත්තර ලියන්න.

ලකුණු 60

**02.** (a) ශ්‍රී ලංකාවේ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා පවත්නා පහසුකම් මොනවාද? (ලකුණු 05)

(b) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ යුතුකම් පහක්(05) ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)

(c) වගකීම සීමාසහිත පුද්ගලික සමාගමක මූලික ගුණාංග පහක්(05) ලැයිස්තුගත කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 15)

03. (a) රේඛනය කරන ලද චෙක්පතක් කුමක්දැයි පැහැදිලි කරන්න. රේඛන වර්ග තුනක්(03) සඳහා උදාහරණයක් බැගින් සඳහන් කරන්න. (ලකුණු 05)

(b) "විවෘත චෙක්" සහ "රේඛනය කරන ලද චෙක්" අතර වෙනස දක්වන්න. (ලකුණු 05)

(c) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ජායා චෙක්පත් නිෂ්කාශන (image cheque clearing) ක්‍රමය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 15)

04. (a) රක්ෂණය සම්බන්ධ පහත දැක්වෙන සංකල්ප තුන(03) කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) හානිපූරණය.

(ii) උපරිම විශ්වාසය.

(iii) රක්ෂ්‍ය හිමිකම. (ලකුණු 06)

(b) ජීවිත රක්ෂණයක වාසි හතරක්(04) ලැයිස්තුගත කරන්න. (ලකුණු 04)

(c) ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් මොනවාද? (ලකුණු 05)

(මුළු ලකුණු 15)

05. (a) අන්තර්ජාතික වෙළෙඳාම සම්බන්ධයෙන් නෞභාර පත්‍රයක වැදගත්කම සඳහන් කර එහි අඩංගු කරුණු හතරක්(04) දක්වන්න. (ලකුණු 06)

(b) ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) ප්‍රධාන කාර්යන් මොනවාද? (ලකුණු 04)

(c) කලාපීය වෙළෙඳ ගිවිසුම් ඇති වීම සඳහා බලපාන ප්‍රධාන සාධක පහක්(05) ලැයිස්තුගත කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 15)

06. (a) ගෝලීයකරණයේ වාසි සහ අවාසි වෙන්කොට හඳුනා දක්වන්න. (ලකුණු 05)

(b) ගෙවුම් ශේෂ දුෂ්කරතා පියවා ගැනීම සඳහා භාවිත කළ හැකි ප්‍රතිකර්ම පහක්(05) ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)

(c) ශ්‍රී ලංකා රුපියලේ අගය 3% කින් අවප්‍රමාණය කිරීමේ ආර්ථික ප්‍රතිවිපාක කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 15)

07. පහත දැක්වෙන ඇ පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(a) ප්‍රධාන හවුල්කරු

(b) සාංගමික ව්‍යවස්ථාවලිය

(c) ඒකක භාර (Unit Trust).

(d) ණය ශ්‍රේණිගත කිරීම

(e) ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය. (එකකට ලකුණු 03 බැගින්, මුළු ලකුණු 15)

- o0o -